# සාමාන්‍ය සමයේ විසිනවවන සතිය
# අඟහරුවාදා

## පළමුවන කියැවීම

ශුද්ධවූ පාවුලු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

රෝම 5 : 12, 15, 17-21

"ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ කරණකොටගෙන සදාතන ජීවනය අප ගෙන දෙයි."

එක මනුෂ්‍යයෙකු නිසා පාපයත්, පාපය නිසා මරණයත්, ලෝකයට පිවිසියාක් මෙන් සියලු මනුෂ්‍යයන් පව් කළ බැවින්, මරණය මුළු මිනිස් සංහතියටම පොදුව පවතී.

එහෙත් දෙවියන් වහන්සේගේ වරප්‍රසාදයේ ක්‍රියාවත් ආදම්ගේ පාපී ක්‍රියාවත් අතර සමානත්වයක් නැත. එසේ කියන්නේ එක මිනිසකුගේ පාපය හැම මිනිසාගේම මරණයට හේතු වූ නමුත්, දෙවියන් වහන්සේගේ වරප්‍රසාදය හා ජේසුස් ක්‍රිස්තුස් නම් එක මනුෂ්‍යයාගේ දයාන්විත දීමනාව බොහෝ දෙනෙකුට විපුල ආසිරි ගෙන දීමේ අමුතුම හේතුවක් වූ බැවිනි. එක මනුෂ්‍යයෙකුගේ පාපය නිසා එකම තැනැත්තෙකු මගින් මරණය සියල්ලන් කෙරෙහි රජකම් කළේ නම්, කොතරම් අධිකතර ලෙස දේව වරප්‍රසාදය හා දේව සබඳතාවට පැමිණවීමේ දීමනාව ලබන හැම දෙන ම එකම ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ කරණකොටගෙන ජීවනයේ රජකම අත්කර නොගනිද් ද? මෙසේ එක මිනිසකුගේ පාපී ක්‍රියාව නිසා හැම මිනිසාට ම දඬුවමේ ඉරණම පැමිණියේ නම්, එක මිනිසකුගේ දැමිටු ක්‍රියාව නිසා හැමට ම ජීවනදායක දේව සබඳතාවේ වරප්‍රසාදය ලැබෙනු ඇත. එක මිනිසකුගේ අකීකරුකමින් සියල්ලන් ම පව්කාරයන් වූ සේ ම, එක මිනිසකුගේ කීකරුකමින් සියල්ලෝ ම දේව සබඳතාවට පමුණුවන ලබන්නෝ ය. ව්‍යවස්ථාව පැමිණි පසු පාපය වැඩි විය. එහෙත් පාපය වැඩි වූ තැන දේව වරප්‍රසාදය ඊටත් වැඩි විය. මෙසේ මරණය සලසමින් පාපය රජකම් කළාක් මෙන් දේව සබඳතාව සලසමින් දේව වරප්‍රසාදය රජකම් කළේය. ඒ දේව

සබඳතාව අපේ ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ කරණකොටගෙන සදාතන ජීවනයට අප ගෙන යයි.

දේව වචනය මෙසේ ය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 40: 6-9, 16

පිළිතුර: සමිඳුනි, ඔබ වහන්සේගේ කැමැත්තට ප්‍රිය වන්නෙමු.

ගීය:

ඔබ පුද පඬුරට ප්‍රසන්න නැත. දවන යාග පූජා හා පාප පූජාවලින් ඔබට වැඩක් නැත. ඒ වෙනුවට ඔබ වදන් අසන පිණිස මාගේ දෙසවන දුන් සේක. එවිට මම "මෙන්න, මම මෙහි ය"යි කීවෙමි.

"මා පිළිබඳ අණ පණත් ඔබේ ව්‍යවස්ථාවලියෙහි ලියා ඇත. මාගේ දෙවියෙනි, ඔබේ කැමැත්තට ප්‍රිය වෙමි. ඔබේ නීති මසිතෙහි නිදන් කර ගතිමි. සමිඳුනි, ඔබට වඳින පිරිස් මැද ඔබේ ගැළවීමේ ක්‍රියා වර්ණනා කළෙමි."

නොනවත්වා එය තවත් වර්ණනා කරන බව ඔබ දන්න සේක. ඔබ සොයා එන්නෝ ප්‍රීති ප්‍රමෝද වී සතුටු වෙත්වා. ඔබේ විමුක්තියට ප්‍රේම කරන්නෝ "හිමි තුමෝ ශ්‍රේෂ්ඨ ය"යි නිරතුරු කියත්වා.

## සුපුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
අවංක පිරිසිදු සිතකින් වචනය අසා පිළිපැද,
නොපසුබට වීර්යයෙන් පල දරන අය භාග්‍යවන්තයෝ ය.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
සිදුවන ආපදා සියල්ලෙන් ජයාන්විතව ගැලවෙන පිණිස ද මනුෂ්‍ය පුත්‍රයාණන් ඉදිරියෙහි පෙනී සිටින පිණිස ද අයදිමින් හැමවිට ම අයදින්න.
ආලේලූයා!

## සුවිශේෂය

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ලූක් 12: 35–38

"ස්වාමියා එන කල දාසයන් අවදිව සිටිනු ඔහු දුටුවොත් ඒ දාසයෝ භාග්‍යවන්තයෝ ය."

"ඔබගේ ඉඟපටි බැඳගන්න. පහන් ද දල්වා තබා ගන්න. තම ස්වාමියා සරණ මංගල්‍යයෙන් පසු පෙරළා අවුත් දොරටු තට්ටු කළ වහාම දොර හරිනු වස් ඔහුගේ ඊම බල බලා සිටින මනුෂ්‍යයන් හා සමානව සිටින්න. ස්වාමියා එන කල දාසයන් අවදි ව සිටිනු ඔහු දුටුවොත් ඒ දාසයෝ භාග්‍යවන්තයෝ ය.

ඇත්තෙන්ම මම ඔබට කියමි. ඔහු තමාගේ ඉඟපටිය බැඳ ඔවුන් කෑමට හිඳුවා ඔවුන්ට උපස්ථාන කරන්නේ ය. ඔහු දෙවන යාමයේ දී හෝ තුන්වන යාමයේ දී හෝ අවුත් එලෙසම දකින්නේ නම් ඒ දාසයෝ භාග්‍යවන්තයෝ ය."

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.